# දෙමළ හත්පත්තුවේ විශ්‍රාන්තිමය රටා

ඒ.එම්.එස්.ජේ.පී.අබේකෝන්

ශ්‍රී ලංකාවේ වයඹ පළාතට අයත් හත්පත්තු හතෙන් එකක් වූ දෙමළ හත් පත්තුවේ ඇදහිලි, විශ්වාස, කෙම් පහන්, ශාන්ති කර්ම, ජන නැටුම් හා නාටක හරහා ඒ ජනයාගේ කායික මානසික විවේකය, නිදහස, සැහැල්ලුව, ජනිත කරවන්නක් විය. ගැමි සංස්කෘතිය ගැන සලකන විට වෙනත් ප්‍රදේශවලට වඩා වෙනස් වූ දෙමළ හත් පත්තුවේ විශ්‍රාන්තිමය රටාවන් විදහා දක්වීම දෙමළ හත් පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම නම් මෙම නිර්මාණයේ කර්තෘ වූ ආචාර්ය මුදියන්සේ දිසානායකයන්ගේ අරමුණ වේ. පිටු 159 කින් යුක්ත වූ මෙම නිර්මාණයේ පරිච්ඡේද 8 කින් සමන්විත වේ. දෙමළ හත්පත්තුවාසීන්ගේ ජන ජීවිතයේ පසුබිම, ප්‍රචලිත ඇදහිලි, විශ්වාස, ශාන්තිකර්ම, ජන නැටුම් හා වෙනත් කලාංග, බෞද්ධ පෙරහැර හා සම්බන්ධ නැටුම් හා ජන නාටක, ළමා ජන ක්‍රීඩා. ජන නාටක, ද්‍රවිඩ මුස්ලිම් ජන නැටුම් හා නාටක කැෆර් ගෝත්‍රික නැටුම් හා ගායනා මේ හරහා ද්‍රවිඩ ජන සමාජයේ පැවති විශ්‍රාන්තිය මනාව අවබෝධ කරගත හැකිය.

ගොයම් නැටුම නමින් අද ප්‍රකට ව ඇත්තේ ගොයම් කපන, පාගන, නෙළන ආකාරය නෘත්‍යයෙන් දක්වන වේදිකා රැගුම්ය. එහෙත් මෙම ප්‍රදේශයේ ගොයම් නැටුම යනුවෙන් හඳුන්වන්නේ ගොයම් කපන අතර, නටමින් ගී කියමින් ඉතා විනෝදයෙන් උඩැක්කි පදයට අනුව ගොයම් කැපීමය..... ඇතැම් කන්නයක මොවුහු විනෝදයට මෙන් උඩැක්කි වයමින් හා ගී කියමින් ගොයම් කපනු දක්නට ලැබේ....... ගොයම් නැටුම සඳහා භාවිත කෙරෙන ගායනා නැදේණියේ සිංදුව, වේදේන සින්දුව, මගුරු ඔයේ පාලමේ සින්දුව, කැරල් සිංදුව ආදිය වේ. මෙම ප්‍රදේශයේ ඇතැම් ගම් ප්‍රදේශයක, විශේෂයෙන් දදුරු ඔයෙන් උතුරු කොටසෙහි නාගයින් අල්ලා නැටවීම දක්නට ලැබේ. නයා නටවන විට ගයන කවි විශේෂයක් තිබේ. එය එළි කවි යනුවෙන් හඳුන්වති.....

"නාග ලොවින් ආ සුළු නයි පැටියා - දැපනේ වැටිලා කෙළිනා හැටියා
රිදී ද තඹ ලෝ පිත්තල තැටියා - දුනොත් හොඳයි මට මෙන් කන හැටියා."

බෞද්ධ පෙරහැරවල විශේෂයෙන්ම දැකිය හැකි ගැමි නර්තන අංගයකි, වැදි නැටුම.. කොටි වෙස්ගත් පුද්ගලයන් දෙදෙනෙකුඑඟ දඬු දෙකක් මත දෙපා තබා පාද හා ලීදණ්ඩ එකිනෙකට සම්බන්ධ වන සේ බැඳ ස්ත්‍රී වෙස්ගත් පිරිසක් විසින් රඟ දක්වන්නකි. කොහොඹ කලේ නැටුම ද්‍රවිඩ ජනතාවට ආවේණික නර්තන අංගයකි. මිළින්ද ප්‍රශ්නය නාට්‍යමය ස්වරූපයෙන් ඉදිරිපත් කලද, එළුවන් කැම, මේවර කෙළිය, කොප්පර කොප්පර පිපිඤ්ඤා හා ලේන්සු හැංගීම වැනි ළමා ජන ක්‍රිඩා අත්වැල් කඩා ගෙන කොටියා එළු කොටුවට පනී.එඟ

කොටියා : එළුවන් කන්ඩයි මම ආවේ
ළමුන් : එළුබෙලි කාපන් තුං බීරේ

එක් අයෙකු හැර අනෙක් ළමෝ සියළු දෙනාම රවුමක් සෑදෙන අයුරින් එකිනෙකා මුහුණ බලමින් වටේට පැමිණෙති. මෙහිදී අත්ත රැගෙන පිටුපස යන තැනැත්තාත් , වාඩිවී සිටින තැනැත්තාත් අතර ඇති දෙබස් ගීතමය ලෙස කියැවෙයි........පනාව මුල් කොටගෙන පනා හැංගීම නම් වූ ළමා ජන ක්‍රිඩාවක් ද තිබේ..........

"දියත් නැනෝ පානාවා අපි නුදුටිම් පානාවා"

බුලත් කෝට්ටු, කෝලාට්ටේ, කාවඩි, කුත්තු හා වේදිකා නාට්‍යඑඟ දෙමළ ජනයා විසින් වයස් සීමාවක් නැති ඔවුහු අත්පුඩි ගසමින් රවුමට නටති. නැටුම නටන්නේ දෙමළ කවි / ගීත ගයමිනි. කෝලාට්ටම්, කාලි අම්මා වෙනුවෙන් විනෝදය උදෙසා කරනු ලබන නර්තන අංගයකි. මෙය බොහෝ විට පිරිමි නර්තන අංගයකි.......... ප්‍රේක්ෂකයන්ට රඟමඬල වටේ හිටගෙන හෝ පැදුරු මත හෝ වාඩි වී නාට්‍ය නරඹති...... ලී කෙළි, කඩු සරඹ, රබන් නැටුම, ගොයම් නැටුම, නයි නැටුම, වැදි නැටුම, රාක්‍ෂ නැටුම, කොටි නැටුම, බ්‍රාහ්මණ නැටුම, බර්ලින් නැටුම හා ජවුසන් නැටුම ආදී........ සිලම්බු අඩි හෙවත් සරම්බිරම් නම් පොලු කැරකැවීම, පතිදූ මිලයට්ටු හෙවත් එක් අයෙකු විසින් බෝල දෙකක් උඩු විසි කිරීමෙන් මාරුවෙන් මාරුවට ඇල්ලීම ඊට උදාහරණ ලෙස සඳහන් කළ හැකිය......... ලී කෙළිය, හජ්ජි, රාමසාන් වැනි ආගමික උත්සව වලදී රඟ දක්වනු ලැබේ. දෙමළ ගී ගයමින් පැය කිහිපයක්ම මෙම ලී කෙලිය එක දිගට ඉදිරිපත් කරන ....

මේ අනුව දෙමළහත්පත්තුවේ ඇදහිලි හා විශ්වාස තුලින්ද ඔවුන්ගේ ජනක්‍රිඩා හා ජන නාටක තුලින් ද, කැෆරි ගෝත්‍රික නැටුම් හා ගායනා තුලින්ද ඔවුන් තුල පැවති විශ්‍රාන්තිමය අවස්ථා හඳුනාගත හැකිය.

දිසානායක මුදියන්සේ, දෙමල හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම, 1996 : ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී ද ඇස් කුලරත්න මාවත, කොළඹ 10.